




# යසෝදරාවත

Non Commercial Distribution. Free For Republishing.

www.thiryak.org

## යසෝදරාවත

1. සාරාසංක්‍ය කප් ලක්සය පෙරුම් පුරා
සොළසා සංක්‍ය කප් ලක්සය පෙරුම් පු රා
සූවිසි සංක්‍ය කප් ලක්සය පෙරුම් පු රා
මෝරා පුබුදු මල ලෙස බුදු වූ ලොව් තු රා

2. නිමනැති සංසාර සාගරය පීන ලා
නිමනැති වස්තු ඇස් ඉස් මස් දන් දී ලා
නිමනැති වීරියක් කෙරුවාය හිත වෙ ලා
නිමනැති බුදු බවට ජීවිත දන් දී ලා

3. දීපංකර බුදුන් ලෝකෙට පහළ වෙනා
සුමේද නම් තපසුව බෝසත් එදි නා
කඳුරැලියේ වැඩ සිටි මහතා එදි නා
මේ මහතා මතු බුදු වෙයි වදාර නා

4. සිරි හස්තෙන් මල් පූජා කළ තැන දී
දෙසිතක් නැතුව නියමයි එක සිත් පැහැ දී
දෝත පුරා වැඳ පිදු රඹගම් පුර දී
නියත විවරණේ ලැබුණේ එතැන්හි දී

5. සූවිසි බුදුන්ගෙන් විවරණ ලබා ගෙ න
ආයුස තිබෙන පමණක් එහි වැඩ සිටි න
වෙසතුරු වෙලා තපසේ ගොස් වැඩ සිටි න
අහස පොළොව මෙන් අන්තිම දන් දෙමි න

6. සහම්පතී වැනි අන්තිම වැඩි ගම න
සම්බ උණේ ළං වී බුදු බව සොඳි න
සැම දෙවියෝ රැස් වී සිට සැළකරන
බඹ ලොව ලක්ස ගණනක් දිව සිරි විඳි න

7. කාලේ බුදු වෙන්ඩ සරි උණි ය මහතු නේ
ආලේ ඉතින් ඇරලා යමු සුවාමි නේ
කාලේ බලා වැඩ සිටි බෝසත් එදිනේ
සීලේ ගුණේ බැලුවොත් උපදින්ඩ අ නේ

8. දී පේ දේසෙ උපදින කුල කොතන බ ලා
කෝපේ නො වී මව්පිය කවුද විමස ලා
රූපේ කවුද සරණෙට මට සිතා බලා
දී පේ උතුම් දඹදිව දිවසින් දැක ලා

9. සුදොවුන් නිසා මායා මව් කුස දැකලා
පන් සියයක් රූ ඇති කිරි මව් දැකලා
අගමෙහෙසුන් කැටුව ම එන බව දැක ලා
ඉතින් දඹදිවට යෙමි මම වදා ළා

10. රන් යහනේ සැතපෙන කල බිසවුන් ට
පුන් සඳ මඬල අහසින් ඒ යහන පි ට
රන් කඳ ලෙසින් වැඩියා සුදොවුන් ළඟ ට
තුන් ජාමෙට පෙනුණා සඳ මඬල ම ට

11. දණක් පමණ මල් අතුරපු දිව යහ නේ
පමණක් බිසව් සැතපෙන කල දුටු සීනේ
මැණිකක් දකින කොට ගැබ ඇතුළට වැදුණේ
මොන මොන දෙයක් දෝ නො දැනෙයි සුවාමි නේ

12. මහමායා සැතපෙන කල මල් යහනේ
අහසින් රිදී පරුවතයක් එම යහනේ
දහසක් බිසෝවරු වට කර මුර සිටිනේ
මහ රජු හට සැළ කෙරුවා මෙම සීනේ

13. නේරංජනං ගංගාවේ සුදු වැල් ලේ
නේරංජනේ ඉස්නානේ නෑවිල් ලේ
පැන්නා වටකරට සුවඳට මන ලොල් ලේ
පෙන්නා දිදී දරු සීනය පෙළින් පෙළ ලේ

14. දෙනෝ දහක් අඟනෝ මට මල් නෙළු වා
අනෝතත්ත විල මැද යහනක ඉඳුවා
කන්‍යා ලියෝ දෙදෙනෙක් පැන් නෑවෙව්වා
අනෝතත්ත විල මම සීනෙන් දුටුවා

15. සුදු සක ලෙසට ඇත් පැටියෙක් විත් යහ නේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අ නේ
සුදු යම් දෙයක් සිදු වෙයි මම දුටු සී නේ
සුද සුන් නිරිඳුනේ මොක දැයි ඔය සී නේ?

16. පිරි සිදු බමුණු ගෙන්නා මහ රජ එදිනේ
කිරි බත් කවා දෙවනුව ඇසුවා සීනේ
නිරි ඳුනි අපල නැත කාටත් ඔය සීනේ
පිරි සිදු බෝසතෙක් උපදි ය ලොවට අ නේ

17. සුද්දෝදන නරනිඳුනේ අසනව ට
නපුරු සීන නො පෙනෙයි පින් කළ අය ට
පෙනුණු සීනෙ දරු සීනේ ම යි ඔබට
පින් ඇති බෝසතෙක් උපදි ය තුන් ලොව ට

18. රන් යහනේ සැතපෙන කල බිසවුන් ට
රන් මාලාවක් තිබුණා යහන පි ට
රන් දම විගස දැමුවා දෙවියෝ කර ට
අලු යම් වේලෙ ඔය සීනෙ පෙනුණි ම ට

19. මහසෙන් රැස්ව කුඩ කොඩි ගෙන වටකර ට
අහසින් ඇවිත් රන් තරුවක් දෙරණ පි ට
විගසින් ඇහිඳ ගත්තෙමි අමයුරු ලෙස ට
සීනෙන් තරුව ගිලුණා මගෙ ගැබ තුළ ට

20. මහමායා සැතපෙන කල මල් යහනේ
මහමෙර මුදුනෙ ආසනයක වැඩ ඉඳි නේ
අසල ගමක පුන් සඳ පිරිමදිමින් නේ
මහ රජුනේ මොක දැයි ඔය දුටු සීනේ?

21. රිදී යහන සැතපෙන කල බිසවුන් ට
පිරී දෙතන කිරි එරිලා කරඬුව ට
රිදී කඳකි නයි පැටියෙකි දරණ ව ට
නැරිය දරු සීන පෙනුණා බිසවුන් ට

22. ඉතින් ඇවිත් බමුණෝ වාසල් දොර ට
සොඳින් සීන තෝරා දුන්නේ රජු ට
මෙතුන් ලොවට නායක පුන් සඳ ලෙස ට
උතුම් බෝසතෙක් උපදි ය තුන් ලොව ට

23. දහස් ගණන් සිටි දෙවඟන අත් හැර ලා
දහස් සිය දහස් දිව සැප අත් හැර ලා
මහත් ගුණැති මායා මව් සඳ දැකලා
අහස් උඩින් පුන් සඳ ලෙස වැඩම ක ළා

24. මායා බිසවුන්ට දොළ දුක් හට ගැනිලා
දයා සිතින් සැම යදියෝ රැස් කරලා
කියා සැම තැන ම වාසල් කරවා ලා
ගියා බිසව දන් සැල් දැක සතුටු වෙ ලා

25. දොළ උපතක් උදු මායා බිසවුන් ට
අරිති වහති වාසල් දොර නුවර ව ට
දොරටු සතර වාසල් හැර දන් දෙන්ට
දොළ සන්සිඳුණි මහමායා බිසවුන් ට

26. දෙවනු දොළක් හට ගත්තේ බිසවුන්ට
නුවර සැම තැන ම දිව පුරයක් ලෙස ට
පවර උතුම් මණ්ඩපයක් සොඳ රුවට
නුවර වට ඇවිද වැඩියා මණ්ඩපෙ ට

27. සල් උයනට යන්ට දොළ දුක් උණි ය ම ට
රන් රිදියෙන් සරසන්නේ උයන ව ට
සතර වරම් දෙවියෝ මුර ජාම ව ට
සන් තොස වෙමින් වැඩමෙව්වේ උයන ව ට

28. සල් උයනට වැඩියේ බිසව් මන ලොලා
මල් පිපිලා බමරුන්නේ නද විපු ලා
සල් කඳ නැමුණි බිසවට බිම පාත් වෙ ලා
කල් දැන දස මාස සපිරිණි ය ගැබ තු ළා

29. මැණික් කරඬුවේ ගනරන් පිළිම ලෙසා
මැණියන්ට පෙනි පෙනි කුමරුන්ගෙ ඇ සා
සැදී නොයෙක් අබරණ පැළඳී යසසා
පෙනී සෑම දෙවියෝ වැඩියා විග සා

30. වඩා සිරිහස්ත සල් කඳ උඩින් ද රා
වඩා පළඳින්ට මල් කඳ නැමුණු පුරා
විඩා හැර අල්ලමින් අත්ත මනහ රා
වඩා වටකරට තිර ඇද එවිසිතු රා

31. කල් දැනුණේ දසෙකඩ මස පිරුණු තැ නේ
රැල් පුළුනේ බරකුත් බඩට නො දැණු නේ
මල් පවනේ එන ලෙස සොඳ සිහිල දැ නේ
සල් උයනේ දී ව ද කුමරු බිහි උණේ

32. අහසින් ඇවිත් දෙවියෝ වටකර සැදු ණේ
දහස් ගණන් සුරඟන වටකර සැදුණේ
වෙහෙස නැතිව බිහි වුණි කුමරු විගසි නේ
මහබඹු ගෙනැත් වැඩුවා රන් දැල සොඳි නේ

33. බිහි වුණි කුමරු පුන් සඳ ලෙස රන් දැල ට
මනනඳ කුමරු බලමින් තුන් ලොව එවි ට
මට වැඩි කෙනෙක් නැති බව දැක තුන් ලොව ට
සිහනද පෑ ය එවිගස කුමරු මනතුට

34. පියුම් සතක් පිපුණි ය ඒ කුමරුන් ට
පියුම් පිටින් වැඩ බැලුවේ සතර ව ට
උතුම් නාද පෑ සිදුහත් කුමරුන් ට
රන් කිරි මේ වඩති එවිගස කුමරුන්ට

35. නොයෙක් කිරිමවුන් දෙපසේ නැර ව ට
දහස් ගණන් නිම නැති ගෝසාව කො ට
දෙපෝදාට පායන පුන් සඳ ලෙස ට
නොයෙක් පෙරහරින් වැඩියා ය රජ ගෙ ට

36. දහස් ගණන් මුරකාවල් වටකර ට
දහස් සිය දහස් දිව මල් සස ලෙසට
දහස් පුන් සඳක් ලෙස ඒ කුමරුන් ට
සොළොස් වයස පිරුණා මේ කුමරුන් ට

37. දුනු සිල්පය සැදුණේ අප බෝසතු ට
යසෝදරා අගමෙහෙසුන් පළමු සි ට
එකුන් තිසක් අවුරුදු ගිහිව වැඩ සිට
උතුම් සිරි සැපත හැර බිසව සහ තුට

38. සසර කළකිරි තපසට සිත් පැහැ දී
බොහොම බිසව් ඇරියේ රජ යන්ට නො දී
කොහොම උණත් අද යමි මම මෙතැන්හි දී
මහණ වෙන්ට කළකිරුණේ උයනේදී

39. දිව යහනේ බෝසත් නැගිට විගසිනේ
ගිහි සැපතය හැර යමි මහණට ඉතිනේ
ඔන්න කවුද දොරටුව ළඟ සිටින්නේ
චන්න මම යි දොරටුව ළඟ සුවාමිනේ

40. සංසාරේ ඇත ම සිට පෙරුම් පි රූ
දැන් කාලේ ආවා පෙරටුව කුම රූ
ඉතින් මහණ වෙන්නේ දැක මගෙ කුම රූ
පින්වත් උතුම් ඉපදුණි රාහුල කුම රූ

41. මගේ යාළු එන්නේ නුඹ ඇත සි ට
අගේ ඇති ගමන් අද විතර යි මෙ ම ට
අගේ ඇතිව ආබරණත් දියන් ම ට
මගේ යාළු අසු සරසා දියන් ම ට

42. ග ලා කඳුළු වැටෙමින් ඇමති එම වි ට
බ ලා මගේ කුමරුන් එම් සහතිකෙ ට
වැඩලා බිසව් සිටිනා මාළිගාව ට
දැකලා බිසව් සැතපෙන සැටි යහන පි ට

43. සිරි හස්තෙන් රන් බාපත අල්ලා ලා
සිරි පද රන් පඩි කඳ පිට තබා ලා
පිරි සිදු යහනෙ සැතපෙන පුන් සඳ ලී ලා
සිරි පද ගත්තෙ ආපසු කිසිවක් නො බ ලා

44. අ මුණක් පමණ මල් අතුරපු යහන පු රා
ප මණක් එරුණි කුමරුට රන් කිරි තිස රා
කව දත් වරද නැති පින්කඳ යසෝද රා
ව ර දක් බුදු බවට පැමිණේ ය අන්ත රා

45. සත් බඹයක් නිල් වරලස මිදී ලා
අත් බඹරෙකු ලෙසට වරලස කැරකී ලා
සිත් ලෙස කුමරු යහනේ කිරි බොන ලී ලා
අත් හැර ඉන්ට බැරි වෙයි රන් කුඹු දැක ලා

46. පෙරුම් පුරා ගෙන එන්නේ ඇත සිට
පතා සතුන් දන් දුන්නේ බුදු බව ට
කතුන් සැමට නායක පුන් සඳ ලඳ ලෙස ට
ඉතින් කතා කෙරුවොත් මගෙ බිසොවුන් ට?

47. රන් යහනේ සැතපෙන මගෙ බිසවුන් ට
ළං කර කුමරු බැලුවෝතින් යහන පි ට
රන් ලිය වැලකි සිරි හස්තය කුමරු පි ට
පින් කඳ බිසව් සැතපෙන සැටි දුටු නෙත ට

48. මැණික් කරඬු කට ලා කිරි බොන කුම රූ
අනික් දෙයක් දුටුව ම මොකට ද නිසරූ
වෙනස්කමක් සිතුවේ නැත මට අයුරූ
සිතක් දරා ගෙන නෙත් දෙක කඳුළු පි රූ

49. සාගර ජලය මදි ඇඬුවා මා සින් දා
කීකරු ළද ලියක් මේ ලෙව් තුළ ඇද් දා?
වෙන් කර අද ම යන්නේ බුදු බව සින් දා
සුන් කර කෙලෙස් දුරු කර එක සිත් පැහැ දා

50. එක අඹු දරු නිසා මම කල් බැඳීම ය
නිම නැති සතුන් සසරින් ගොඩ ගැනීම ය
අද මම මහණ වෙමි ආලය හැරීම ය
පුදුම කුමරු රුව ඇති මගෙ රාහුල ය

51. පැතුම් බලෙන් දෙන්නා ආවේ පේවී
කතුන් සැමට නායක බිම්බා දේ වී
ඉතින් සසර ඇවිදින්නේ නැත දේවී
ගොසි න්බුදුව එන කල් සිටපන් දේ වී

52. සඳුන් සුවඳ මල් අතුරපු යහන පුරා
යොදු න්ගණන් පැතිරෙයි සුවඳ මනහ රා
රුවින් උතුම් රුව ඇති මගේ යසෝද රා
සොඳි න්බුදුව එන්නෙමි මම එලොව්තු රා

52. පිරිසිදු එරන් කඳ සේ බිසවුන් හැරලා
සිරිපද මම ගත්තේ ආපසු නො බලා
වීරිය කරන්නේ බුදු බව සිහි කර ලා
සූරිය මඬල මෙනි ආපසු වැඩි ලී ලා

54. ආවේ එන්ඩ අපි දෙන්න ම ඇත සි ට
කීවේ යාළු අපි දෙන්න ම ඇත සිට
ඇසුවේසුවාමිනි කොයිබට වඩින්නට
ඇසුවේඇමති වැඳලා සිරිපා දෙක ට

55. පාළු වේ ය වැඩියෝතින් මෙ අප ර ට
සාළු සළු ද පැළඳී රන් කඩු අත ට
වේළු බුදු බවට බාදා නො කර ම ට
යාළු ඇමති අසු සරසා දියන් ම ට

56. කඩ කඩා වචන නො කියති බෝසතුට
අඬ අඬා ගොසින් කන්තක අසු ළඟ ට
අඬා දොඩා අසු සරසයි සොඳ රුවට
වඩා සිරි හස්ත පිරි මැද අසුගෙ පිට

57. සැරසී කුමරු සැණෙකින් යන්ට එම ව රා
සිරිගණ සිරි පතුල් පඬි කඳට බර කරා
සිරි රන් කඩු මුණෙන් ඇරලා එරන් දො රා
පිරිය රාහුල ය සහ බිසව් සිහි ක රා

58. ස රණ අදහ මහණට වඩින ගමනටට
බ රණ පැළඳ සැතපෙන කුමරු ළං කො ට
ව රල නිල් කලඹ මුදලා යහන පිට
ද රණ උඩ බලා අක් බඹරෙකු ලෙස ට

59. ස මන් පිච්ච මල් අතුරපු යහන පිට
ගි මන් ඇර බිසව් කුමරුන් තුරුළු කො ට
රුවන් කිණිහිරිය මල් ගෙතුවා ලෙස ට
ද මන් සිරි හස්ත කුමරුන්ගෙ ඇඟ පි ට

60. ළැඳී සිතින් මතු බුදු වෙන බව පතන
විඳී සිරි සැපත හැර තපසට වඩි න
බැඳී සසර ගිහි ගෙයි ආලය අරි ණ
මිදී නිල් වරල ඇඳ පාමුල දර ණ

61. සෝම ගුණ සිසිල සිඹ සනසන මුහුණ
පේම ගුණ සොබන කුමරුන් වඩා ගෙ න
පුන් සඳ ළඟ සිටින රන් තරුවක් ලෙසි න
පුන් සඳ මෙන් වඩිති කුමරුන් සිහි කර න

62. පුන් සඳ ලෙසට බෝසත් වැඩියා ය පි ට
රන් කඳ කුමරු ඇර යම් ඉතින් කෙලෙස ට
රන් කඳ ලෙසින් වැඩියේ ගංගා තෙර ට
පින් ඇති මගේ අඹුදරු දකිම් ආවිට

63. සසර තිබෙන අගුණය දැක කළකිරිලා
පතර එකන්තක අසු පිට පැන නැගි ලා
කතර තිස් යොදුන් හිමගත ගෙවාලා
නතර වෙන්ඩ වැඩියේ ගං තෙර ද බ ලා

64. පැනලා වැලි තලෙන් අඩි තර බර කර ලා
හයලා කට හඬින් හේසාරව කරලා
නෙ ර වාදෙකන් පොතු අසු කරකැවී ලා
පිනවා ලෙව කෑ ය කුමරුන්ගෙ දෙපතු ලා

65. ඇසළ මසේ පුර පසළොස්වක් එදින
එතෙර වෙලා ගංගා වැල්ලට පැමිණ
අබරණ මුදාලා සන් ඇමතිට දෙමින
එතෙර වෙන්ට ගංගාවෙන් වදාර න

66. පවර උතුම් මගෙ හිමිසඳ ඔබ හැරලා
ඉවර නො වන ගිනි කඳ අප හට දී ලා
අවර ගිරග වැටුණා ලෙස වේ ය මුලා
නුවර ගොසින් මම ඉන්නේ කවුරු බලා?

67. පිරිසිදු එරන් කඩුවක් සුරතට ගනි තී
පිරිමැද කේස දාතුව අහසට අරි තී
සිරි කුල උතුම් සක් දෙව් දාතුව ගනි තී
පිරිකර පළමු කොට දුන්නේ සහම්පතී

68. අඬා ඇමති බිම පෙරළෙයි දෙරණ පි ට
වඩා සිරිහස්ත දිගු කොට අසු ළඟ ට
කඩා දමා යමු තුන් දෙන ම නිවනට
අඬා මැරී අස් රජ ගියෙ දිව පුර ට

69. අස් රජු සමග බෝසත් නැති සෝකේ ට
හිස් කර අරින්ඩ ද අද හිමි මා ගමට?
රැස් කර කියමි උණු දේ පිය නිරිඳු හට
විස් තර හිමි සාමි අවසර මට යන්ට

70. ආබරණ ද අවසර දී ඇමති හ ට
සාගර ජලෙන් පලයන් පසු නො බැස සි ට
පිය නිරිඳුට කිය මගෙ පුතු දැක ඉන් ට
යසෝදරා දේවිට කිය සැනසෙන් ට

71. ච න්න ඇමති නුවරට ගිය කල එදිනේ
ඇන්න පැනපු සිහ දෙන ලෙස බිසව් අ නේ
ච න්න යාළු මගෙ හිමි සඳ අද කොත නේ?
ගෙන්න වරෙන් මගෙ හිමි සඳ දකින මෙ නේ

72. රැන එරන් කෙඳි සේ රන් කෙඳි පීරා
පීන පයෝදර ගනරන් කරඬු යුරා
වහම මොක් නිවන් සාදන මුනිඳුපුරා
යහන පිට වැටී අඬතෙයි යසෝ දරා

73. සිතා ගෙන ගියේ බුදු වෙන්ඩ ම යි සිත
පතා ජාතියේ ඔබට ම සරණ වෙත
පතා ඉතින් බැඳ දුන්නේ මීට අත
කතා නො කර මට වැඩියේ මන්දසිත?

74. මුව ජාතියේ ව ද පළමුව උපන්නේ?
එම ජාතියේ සිට නැර ම මම එන්නේ
කොයි ජාතියේ උපණත් මෙහෙසුන් ව න්නේ
මේ ජාතියේ ඇයි මා තනි කර යන්නේ?

75. එ දා ගියේ තපසට දෙන්න සහ කැලේ
වඩා දෙදරුවන් උකුළට රැගෙන ලො ලේ
බෙදා උණිමු පන්සල් දෙක ම එක කැලේ
මෙදා මොකද තනි කර යන්ට මම ක ළේ?

76. සි තා ගෙන ම වැර වෑයන් කර උණි මි
ප තා පෙරුම් බලයෙන් නැර ම ආමි
ගොතා දෑත බැඳලා අප දන් දුණි මි
ක තා මට නො කර වැඩියේ මන්ද හිමි?

77. තෙමා වැටේ මගෙ සළුපිළි නෙත් පුර වා
අ මා රසක් වැනි හිමි සඳ සිහි වෙන වා
ද මා කුමරු වැඩියා මට සිහි වෙනවා
මෙමා ඇර ලියෝ ලෙව් තුළ ඇද්ද ත වා?

78. උන්නෙමු අපි ඉපිද ලෙහෙනුන් කුලේ එ දා
වැටුණේ ජලය මැද සමුදුරයේ බිළිඳා
දැනුණේ කරපු වීරිය ගොඩ ගන්ට එ දා
හිමි රජුනේ මග ඇරියේ මන්ද මෙදා?

79. රුව ඇති පුතුන් වැදුවා මම වැරදීද?
රුව ගුණ තේජසක් මගෙ අඩු වුණා ව ද?
ගරු සරු නැතිකමක් මාතින් යෙදුණාද?
මරු බිඳ බුදු වෙන්ඩ සීනෙන් පෙනුණා ද?

80. කි රලා බිජු රකින සැටි හිමි අසන්නේ
වැරලා දෙපය අහසට නගමින් ඉන්නේ
අ ඬලා මගෙ ළසෝ ගිනි දැන් ඇවිළෙ න්නේ
නොව ලා ළැමද අත තබමින් අඬන්නේ

81. වනන්තරේ සෙවණැලිවල සිටින්නේ
ගිමන් හැර සයන අඳුරට නො පෙනෙ න්නේ
නිරන්තරේ මට ගිනි කඳ ඇවිළෙන්නේ
රන් බඳ ළැමද අත තබමින් අඬන්නේ

82. සු වඳ බොජුන් වැළඳූ මගෙ හිමි සඳ ට
නි බඳ බොජුන් රස කර දුන් වළඳන් ට
සු වඳ පලාපල වැව්යන් හිමියන් ට
සු වඳ මල් නිතර පිපියන් රන් කඳට

83. පි රිය ලෙසට සැතපුණු අපෙ මල් යහ නා
බැරිය ඉතින් දැකලා මගෙ පපුව දනා
වී රිය බුදු බවට බාදා නො ව වඩිනා
සූ රිය මඬල වැනි ඔබ සැතපුණු යහ නා

84. වෙසතුරු වෙලා වැඩි දා ඔබ සිහි ඇද් දා?
රස තුරු හිමේ සොයමින් රැක්කා නො වෙ දා?
කරදර සිතක් සිතුවේ නැතුවා නො වෙ දා?
පරතෙර නැතිව රැක්කාව ද මහිමි ස ඳා?

85. සඳ ලප ලෙසට කැටුව ම ආවා නො වෙ ද?
අ ද මා හැර යන්ට කීවේ කවුරුන්ද?
සඳ මහ නුවර ඉන්නට කිව්වා නො වෙ ද?
එදා අඬ අඬා පස්සේ ගියාව ද?

86. බාදා නැතුව දන් දුන්නේ කුමරු මෙ මා?
එ දා ඉතින් මම වේස්සන්තරව තමා?
ව දා රුවට සිටි කුමරුන් රාහුල මා?
මෙදා ඉතින් වැඩියේ ඇයි ද මා දමා?

87. ර හසක් මගේ කවදා වත් නැත මෙතු රා
වෙහෙස ක්වෙන්ට ඇරියේ නැත යසෝද රා
ය හපත් මම ඇඬිමි නිම නැතිව නුඹ ක රා
ද හසක් ගුණැති මම ව ද සොඳ යසෝද රා?

88. කාරණාව බුදු වෙනවා ලකුණු දැනේ
නෑ රනැටු ව ආවා මම සරණ ගෙ නේ
බාව නාව තොර නො කරමි සිතින් අ නේ
මාළි ගා ව අද අඳුරු යි සුවාමි නේ

89. ද රුවන් එදා අත් බැඳලා දන් දුන්නේ
එරුවන් තනේ කිරි එරිලා කුමරුන්නේ
අ ඬමින් එදා සිරි පා මුල වැටෙමින්නේ
මෙලෙසි න්වෙහෙස වුණු මට ඇයි ගිනි දු න්නේ?

90. කිඳුරු වෙලා අපි දෙන්න ම උපන්නේ
අඳුරු සඳ පව්ව එකඟව වැස උන්නේ
සොඳුරු අපි දෙන්න එක රැට වෙන්උණේ
දෙ දරා ඉතින් අද දක්වා අඬ න්නේ

91. ග ණන්නැතුව අප දුන්නේ අත් බැඳ දා
ග ණන්නැතුව ඇඬුවේ මම ඔබ සන් දා
කි යන් ඉතින් මම කළ වරදක් ඇද් දා?
හෙමින්මහණ වෙන්නට වැඩියේ ඇයි දා?

92. නිම නැති සතුන් වුණු කාලේ පෙරුම් පු රා
පියයුරු පෑවේ නැත කවදත් වෙනස් ක රා
මේ වැනි පෙරුම් පිරු මට කරන අනද රා
අම යුරු මම නො වෙ ද බිම්බා යසෝද රා?

93. අනගි මුතු මැණික් අබරණ ගළවාලා
අනගි රන් පේස පා මුදු ගළවාලා
කනක කුණ්ඩලා බරණත් ගළවාලා
මලානිකව සිටියේ බිසව ගල්වෙලා

94. විලාප කිය කියා ඉඤ්ඤ යි අඬා දොඩා
ගලා කඳුළු නිම නැතිව ම ඇඬුම් අඬා
කලා පිලා උණු තැන් නිම නැතුව අ ඬා
කරලා මෙමට ගියෙ දෝ වෙන දාට ව ඩා?

95. ඇතා වෙලා හිමයේ ඔබ උපන් එ දා
සිතා ඇවිත් විද හෙළුවේ වැදි නො වෙ දා?
පතා අහිරිගා සිටියේ මම නො වෙදා?
පුතා දමා වැඩියේ ඇයි මහිමි ස ඳා?

96. මහ ඔසු පඬිව ඔබ මට කරපු පුවතරා
අඹරා බත් මාළු ඇඟ ඉස සිට තවරා
නො මරා මරන්නට කළ දේ මට මිහි රා
අමරාපති දේවිය මම යසෝද රා

97. නිම නැති තපස් රැක්කා මම කැටුව ගොසි න්
එම දවසේ වත් නිම නැති වැඳුම් පිදු ම්
පමණක් වරද වත් සිහි නැතිව මට ඉති න්
එහෙම හිටපු මා ඇයි තනි කළේ ඉති න්?

98. හිමයේ ගොසින් මල් යහනක නිදනව ද?
කොමළ අනගි සිරිපා දෙක රිදෙනවද?
හිගේ නැතිව දෙවියෝ මුර කරනවද?
මගේ ඇත් රජුනි හිමි අද කොතැනක ද?

99. සෑම වරද තිබුණත් හිමියනේ ම ට
කෑම රස බොජුන් දුන්නෙමි සොඳ රුව ට
බෝම එපිට වඩිනා හිමය පසු කොට
සෑම සියලු දෙවියෝ පිහිට යි ඔබට

100. කැලේ තිබෙන කොයි දේ වත් රස වේ     වා
මලේ බඹරු ලෙස පිරිවර ඇති වේවා
අච්චේ තිබෙන රැස් මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාළිග සෑදේ වා

101. කියන මැසිවිල්ල හිමි හට නො ඇසෙන   වා
රන් කඳ මහිමි මට හීනෙන් නො පෙනෙන වා
කම් රස විඳීමක් නැත මම දිවුරනවා
වෙන් කර ගියත් මම සීලේ පිහිටනවා

102. වෙහෙස උණත් තද දුක් මම ඉවසඤ්ඤැ     යි
අහස පොළොව ලෙස හිමි සිහි කර ඉඤ්ඤැ       යි
රහත් වෙන්ඩ මම වෑයම් කරඤ්ඤැ යි
ඇහැට දකින තුරු නව ගුණ පුරවඤ්ඤැ     යි

103. සත් දවසක් අඹ උයනේ වැඩ සිටලා
සත් වෙනි දා රජගහ නුවරට වැඩලා
පෙරත් බුදුන් කළ දේ දිවැසින් දැකලා
ගෙනත් අහර වැළඳුවෙ ගං තෙර ද බලා

104. බිම්සර රජුට අවසර දී වැඩම ක ළා
පළමුව බණ ඔබට දෙසමැයි වදා ළා
උරුවෙල් දනව්වට බෝසත් වැඩම ක ළා
අවුරුදු සයක් එහි තපසේ වැඩ සිටලා

105. පුන් සඳ ලෙසට බුදු බඳ රුව වැඩුණු ක     ලා
සුන් කර මරුන් බිඳ බුදු බවට නිකස ළා
සුජාතාව දුන් කිරි පිඬු වැළඳු ක ලා
එරන් තලිය ඇරියා උඩු ගඟ ඉහ ළා

106. විත්තිය කිය කියා එන්නේ පළමු සිට
සොත්තිය බමුණු දුන්නා කුස තණ එවි     ට
සිත් ලෙසට ම ගෙන වැඩියේ බෝ මුල     ට
තුදුස් රියන් විදුරාසන දුටු නෙත   ට

107. පුරා දහම් සිහි කර මුනි වැඩ සිටලා
දරා වටකරය දෙවියෝ මුර කර   ලා
පුරා මාර සෙනගක් බෝමැඩ පිරි ලා
ලොව්තුරා බුදුව දස බිම්බර බිඳ   ලා

108. පන් දහසක් පවතින දහම් මෙලොව ට
පින් කඳ පළමු බුදු වී ලොව බලා සි ට
සුන් කර සැම සතුන් සසරින් මුදන්නට
දම් සක් පැවතුවා මුනි රජ පළමු කො     ට

109. උතුම් මුනි රජ ද දිවැසින් බලා සි ට
තුන් ගමනක් වැඩියේ නිසි පිළිවෙළට
පන්සාලිස් අවුරුදු වැඩ සිටින්න ට
සුදසුන් රජ නිසා වැඩියේ ය නුවරට

110. උතුම් නුවර දිව පුර ලෙස සරසා ලා
පන්සියයක් රහතුන් පිරිවරා ලා
දහම් දෙසති නෑයන්හට වැඩම කළා
රන්වන් බුදු රැසින් සිය නුවර පටලලා

111. පිරිසිදු රිදී කඳ සේ අභිරිගා බිසව්
සවනක් බුදු රැසින් සියොලඟ වෙළාබිසව්
පිරිවර සමග රන් ලියවැල ලෙසටබිසව්
සිරිපද පිට වැටිලා ඉඳ අඩති බිසව්

112. සම්පත් දියන් කියලා රාහුල කුම රූ
පුන් සඳ වට දිලෙන රන් තරුව පිරිවැ රූ
දහම් දෙසති එක් සිත් පහදා කුම රූ
මහණ කළේ එවිගස රාහුල කුම රූ

113. සුද්දෝදන නිරිඳුට බණ වදා ළා
ලද්ද සෝක හැර දහමට සිත නැමිලා
වින්ද සැපත් හැර බිසවුන් මහණ වෙ ලා
සුද්ද ඇතුව සිල් රැක්කේ නැණින් බලා

114. ක ලක් මෙහෙම සිල් රැකලා යසෝද රා
තෙ ද ක්පාම් දෙව් මිනිසුන්ගෙ සැක හැ රා
සු ගත් බිසව් මහණට යති යසෝදරා
ප ලක් බැඳ එවැඩ උන්නේ යසෝදරා

115. පින් කළ අයට කාටත් මෙහෙම සත හ ට
සුන් කර කෙලෙස් දුරු කරලා විගසක ට
අහස පලක් බැඳ වැඩ උන්නා එවි ට
රාහුල මාතාව මම් ව ද පළමු සි ට?

116. පිරිසිදු සිල් රකිමි අවසර රැගෙන සිට
නො හැර කෙලෙස් දුරු කර බිසව් හණික ට
සිරි සැපතට පැමුණුණු බිසව් හණිකට
පන්සිය පිරිනිවන් පෑවා ය එම වි ට

117. බැඳපු දා ගැබක් ඒ දාතු පිහිටු වා
පිදූ සැම දෙන එක මල් වරුසා වා
සිදුහත් බුදු වෙලා පින් කඳ වරුසාවා
බුදු වී හස්තයෙන් සෑයට මල් පිදු වා

118. සකල සම්පත් හැර දමා ගොස් පැවිදි වූවා මෙහෙණි ස ස්නේ
සකල බව දුක් බින්දවා හැර රහත් වී බබළවා සස්නේ
සකල නරගණ දෙව් බඹුන් ඈ පිරිස් හට දන් දෙමින් ස ස්නේ
සකල සැපතින් අග්‍ර නිවනට යන්ට අවසර ගෙන නො ල ස්නේ

119. ලැබුණු තැන සිට නියත විවරණ බුදු වෙනා ලෙස මේ කපේ දී
යෙදුණු තම චායාව විලසට නො හැර ආ බැව් සැම තැනේ දී
බුදු වූ තැන සිට වෙන්ඩ අවුදින් පළමු නිවනට යන තැනේ දී
පුරුදු ඔබ ලැබූ නොයෙක් ඉර්දිය පාපු පෙළහර සැම තැනේ දී

120. පැන නැගෙමින් සත් සමුදුර ජලය පිටට නො ලසින් දා
වෙන කිසි යම් දෙයක් නො පෙනි මූද පුරා මසෙකු ලෙ දා
දෙව් මිනිසුන් වෙත පාමින් පෙළහර මේ ලෙස එළ ඳා
යස එළඳුන් යසෝදරා නිවන් පුරට ගියෙ නො ර ඳා

121. නෙකනෙකඉර්දි බල පාමින් මුනිඳුට පුදමින් පෙළහැ ර
දැ කදැ කමුනිඳුන්ට පෙනී අහසට වඩිමින් නෙක ව ර
දු කදු ක නසමින් නිවනට පැමුණුණු උත්තම යසොද ර
එ කළු ක මුවකින් ගුණ කඳ කියනු කෙලෙස දෝ මෙම ව ර?

122. තලෙක දෙතලෙක තුන් තලෙක ඈ පිළිවෙළින් අහසේ සිට න්
ඉඳුරුපති මහ බඹ ද නා ගුරුළුන්ගෙ නන් වෙස් ගෙන සොඳි න්
අවට සැදි සිටි පිරිස් හට මම යසෝදරා ය යි පවසමි න්
සුගත සමිඳුට නොයෙක් තුති දී පැවෙ එදවස පිරිනිව න්

123. මෙබඳු පාදේ උපන් සැම ඉතිරින්ගෙ මස්තක පිට සෑ දූ
කිරුළයක් බඳු යසොදරා දේවියගේ ආකාරය සු දූ
සවන කරමින් සියලු දිගැසින් මතු එමෙන් උපදින ලෙ දූ
සකල පින් කරනා වූ අටියෙන් සිත් දරව් මේ බණ ක ඳූ

124. මොක් සැප පතා වසනා ලෝ සතා සිතා
දු ක් දැක සසර ආලය හළ හොතා යුතා
දු ක් ලැබ නෙ දන රැස් කරනා සිතා යුතා
දු ක් කර කල් නොයිඳ පින් කළ හොතායුතා

125. අ සමින මේ දහම් අඟනෝ ගෙන සිත ට
යටැසින රවා වත් නො බලා තම හිමි ට
ව සමින රන් රස සෙ එකඟින් අදර කො ට
උ ප දිනු යසෝදර බිසවුන් ලෙස සොඳ ට

126. හි මි ට ඇති පහසු අපහසු නො බල මිනී
අ ප ට මෙනම් දෙය දෙය ගෙනව කියමිනී
සි ත ට දුක් දෙවන බස් කිසි නො කිය මිනී
සො ඳ ට සිටිනු මැන සිය හිමි වෙත පෙ මිනී

127. දු කක් වන් කලට අත මිට හිඟ වෙමි න
සෙ ත ක් වන් කලට වැඩියෙන් දයාවෙ න
ඇ ද ක් නො ව කතුනි හිමි සැලකුවෝති න
කිමෙක මොක් දකිනු බැරි යසොදරා මෙන?

128. රැක පතිදම් යසෝදර බිසවුන් ලෙස ට
දුක සැප දෙකෙහි වෙනසක් නො ව එක ලෙස ට
එක හිමි පතා සිටියොත් ළඳුනි බැති කොට
සැක නැත සගපවග මතු වර ලැබෙනව ට

129. ඉන්නිසා ලියනි හිමි හට යටහති න
දොම්න සා නො වී ලෙඩ දුකෙහි සතති න
අන්දෙසා නො ලා සිතු යසොදරා මෙ න
පින්රැසා කරවි සග මොක් ලබන මෙ න

130. සැමා සුරනි ගෙන පින් සිත යුරා පු රා
යොමා සුබ වැඩෙහි සිත නිරතුරා තිරා
පෙමා කර සතන් රැක දුක් දුරා හැ රා
අ මා මහ නිවන් ලබනුය තිරා ස රා

**යසෝදරාවත නිමි**